# ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය (එස්ඊයුඩීපී) - අදියර 1 ඒ -2012

## 1. මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 3 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගතවන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැර, මාගේ මතය වනුයේ,

(අ) 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව, 2012 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය ගිවිසුමෙහි දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූරණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඉ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මූල්‍ය කාර්යය සාධනය

මූල්‍ය ප්‍රකාශන හා ලබාගත හැකි වූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘති වියදම රු.84,995,519 ක් වූ අතර 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.951,027,574 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වියදම, ඉකුත් වර්ෂය සඳහා වියදම හා 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළබඳ සාරාංශයක් විවිධ වර්ගයන් යටතේ පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| වියදම් වර්ගය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | | 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | 2012 | 2011 | |
| | රු. | රු. | රු. |
| නේවාසිකාගාර සංකීර්ණය | 10,466,468 | 17,737,183 | 315,300,478 |
| සේවක නිල නිවාස | 2,843,292 | 1,626,000 | 148,871,451 |
| ශිෂ්‍ය මධ්‍යස්ථාන | 16,430,119 | 10,925,654 | 53,442,166 |
| ඉස්ලාම් අධ්‍යයන පීඨය | 16,452,199 | 65,755,028 | 138,886,135 |
| ක්‍රීඩා භූමිය හා නැරඹුම්හල (Pavilion) | 4,064,642 | 18,984,091 | 48,005,659 |
| තාක්ෂණ පීඨය | 7,901,411 | 50,493,075 | 106,598,064 |
| සෞඛ්‍ය මධ්‍යස්ථානය | 989,767 | 9,396,073 | 22,257,694 |
| සේවක නිල නිවාස සඳහා ලී බඩු හා උපකරණ | 7,868,318 | 2,037,899 | 12,220,143 |
| උපදේශක සේවා ගාස්තු - | | | |
| දේශීය | 2,094,968 | 5,240,497 | 44,825,403 |
| විදේශීය | 2,451,237 | 1,623,041 | 18,368,499 |
| ශිෂ්‍ය නේවාසිකාගාරය සඳහා ජල සැපයුම් පද්ධතිය | 5,770,144 | | 5,770,144 |
| ස්ථාවර වත්කම් | 68,096 | 210,504 | 292,460 |
| කාර්යාල උපකරණ | 390 | - | 2,196,812 |
| විවිධ වියදම් | 7,594,468 | 7,690,798 | 33,992,466 |
| එකතුව | 84,995,519 | 191,719,843 | 951,027,574 |

## 3. විගණන නිරීක්ෂණ

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2007 ජුලි 17 සිට 2012 දෙසැම්බර් 31 දක්වා කාලපරිච්ඡේදය සඳහා ව්‍යාපෘතියේ සමුච්චිත වියදම රු.951,027,574 ක් වූ අතර, එයින් රු.10,821,354 ක් වූ වියදම් ඌන පූරණය සඳහා ඉල්ලීම් කර තිබුණි. කෙසේ වුවද අදාල ඌන පූරණයන් කුවෙට් අරමුදලින් සිදු කර නොතිබුණි. උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අදහස් දැක්වීම්වලට අනුව මෙම මුදල තැන්පතු අරමුදල් ගිණුමට ( DF Account ) මාරු කිරීමට එකඟවී තිබුණි.

(ආ) ජාතික ලංසු කැඳවීම් ක්‍රියාවලියට අනුව, කොන්ත්‍රාත් දෙකක් යටතේ සේවක නිල නිවාස වලට ගෘහ භාණ්ඩ විෂයයන් මිලදී ගැනීමට හා සවිකිරීමට ආයතන 05 කින් ටෙන්ඩර් ලැබී තිබුණි. මෙම ටෙන්ඩර් අතුරින්, අඩුම ලංසුව ඉදිරිපත් කල සැපයුම්කරුගේ ලංසුව කිසිදු හේතුවක් නොදක්වා ප්‍රතික්ෂේප කර, දෙවැනි අඩුම මිල ගණන් ඉදිරිපත් කල සැපයුම්කරුගෙන් අඩුම ලංසුව ඉදිරිපත්කල සැපයුම්කරුගේ මිල ගණන්වලට ගෘහ භාණ්ඩ විෂයයන් මිලදී ගෙන තිබුණි. මෙම ආයතන දෙකම එකම ස්ථානයේ ක්‍රියාත්මකව තිබුණද, අඩුම ලංසුව ඉදිරිපත් කර තිබුණු ආයතනය සඳහන් කර තිබූ ප්‍රවාහන වියදම් ඉක්මවා, ප්‍රවාහන වියදම් රු.70,000 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඇ) ව්‍යාපෘති ගිවිසුමේ ඇමුණුම් 02 ප්‍රකාරව 4 වන සංරචකය එනම් අධ්‍යාපන සංවර්ධන සැලැස්ම ව්‍යාපෘති කාලපරිච්ඡේදය අවසානය දක්වාම ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) ව්‍යාපෘතිය සම්පූර්ණ කර තිබුණු නමුත්, ව්‍යාපෘතියට අදාළ සම්පූර්ණ ප්‍රගති වාර්තාව සමාලෝචිත වර්ෂය අවසානය දක්වා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. එබැවින් ක්‍රියාකාරී සැලැස්මට අනුව, ව්‍යාපෘතියේ කාර්යසාධනය සම්බන්ධයෙන් විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය.

## 4. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 4.1 මූල්‍ය කාර්ය සාධනය

2012 වර්ෂය සඳහා වාර්ෂික ඇස්තමේන්තුවට අනුව වියදම් ශීර්ෂ 171 - උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ව්‍යාපෘතිය සඳහා රු.106,500,000 ක ප්‍රතිපාදනයක් සලසා තිබුණි. සලසා තිබුණු ප්‍රතිපාදනය සහ දරන ලද තත්‍ය වියදම හා අරමුදල් ඌන උපයෝජනය පහත දැක්වේ.

| වැය ශීර්ෂ වියදම්විස්තර | 2012 වර්ෂය සඳහා ප්‍රතිපාදනය | 2012 වර්ෂය සඳහා තථ්‍ය වියදම | ඌන උපයෝජනය | |
|---|---|---|---|---|
| | | | මුදල | ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
| | රු. | රු. | රු. | % |
| විදේශාධාර - ණය | 2,500,000 | 2,451,237 | 48,763 | 2 |
| ප්‍රතිපූර්ණය කළ හැකි විදේශාධාර - ණය | 60,000,000 | 59,384,750 | 615,251 | 1 |
| විදේශාධාර සම්බන්ධ දේශීය අරමුදල් | 44,000,000 | 23,159,533 | 20,840,467 | 47 |
| | 106,500,000 | 84,995,519 | 21,504,481 | 20 |

### 4.2 ව්‍යාපෘතියේ භෞතික කාර්යසාධනය

ව්‍යාපෘතිය විසින් ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තා අනුව, 2012 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත් පිළිබඳ භෞතික කාර්යසාධනය පහත පරිදි වේ.

| ව්‍යාපෘති කාර්යයන් | කොන්ත්‍රාත් වටිනාකම රු. | නිම කළ යුතු දිනය | නිම කරන ලද දිනය | නිම කිරීමේ ප්‍රමාදය (මාස වලින්) | 2012 අගෝ. 31 දක්වා ගෙවන ලද මුදල රු. | මූල්‍ය කාර්යසාධනය % | භෞතික කාර්යසාධනය % |
|---|---|---|---|---|---|---|---|
| 1. නේවාසකාගාර සංකීර්ණය | 287,096,828 | 2010.07.15 | 2010.11.05 | 03 | 315,300,478 | 109.82 | 100 |
| 2. සේවක නිල නිවාස | 131,309,050 | 2010.04.15 | 2010.04.15 | | 148,871,451 | 113.37 | 100 |
| 3. ශිෂ්‍ය මධ්‍යස්ථානය | 54,865,015 | 2011.06.07 | 2012.03.10 | 09 | 53,442,166 | 97 | 100 |
| 4. ඉස්ලාම් අධ්‍යයන පීඨය | 111,433,936 | 2011.05.08 | 2011.12.20 | 07 | 138,886,135 | 124.64 | 100 |
| 5. ක්‍රීඩා භූමිය හා නැරඹුම්හල | 38,992,117 | 2011.06.29 | 2011.12.20 | 06 | 48,005,660 | 123.12 | 100 |
| 6. තාක්ෂණ පීඨය | 117,046,400 | 2011.05.12 | 2011.08.31 | 03 | 106,598,064 | 91 | 100 |
| 7. සෞඛ්‍ය මධ්‍යස්ථානය | 21,267,927 | 2010.10.31 | 2011.03.15 | 04 | 22,257,694 | 104.65 | 100 |
| 8. ශිෂ්‍ය නේවාසිකාගාරය සඳහා ජල සැපයුම් පද්ධතිය | 5,770,144 | | 2012.08.27 | - | 5,770,144 | 100 | 100 |
| 9. නිල නිවාස සඳහා ලී බඩු | 11,501,917 | - | - | - | 11,501,917 | 100 | 100 |
| 10. නිල නිවාස සඳහා උපකරණ | 718,227 | - | - | - | 718,227 | 100 | 100 |
| **එකතුව** | 780,001,561 | | | | 851,351,936 | | |

මුළු කොන්ත්‍රාත් වටිනාකම රු.780,001,561 ක් වුවද, දරන ලද තථ්‍ය වියදම රු.851,351,936 ක් විය. එබැවින් වියදම රු.71,350,375 කින් ඉක්මවා තිබුණි.